


**යමෙක් ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලකි. පරණ දේ පහව ගියේය; බලන්න සියල්ලම අලුත් වී තිබේ.** (2 කොරින්ති 5 : 17).
ක්‍රිස්තු භක්තිකයෙක් සහ සමාජ සේවකයෙක් දුප්පත් මිනුෂයෙක් දෙස බැලුවේය. සමාජ සේවකයා මෙසේ කීවේය. "මා කැමතියි මේ මනුෂයයා අලුත් ඇඳුම් ඇඳ සිටිනවා දකින්න." මිනිස් සමාජය සිතන්නේ මනුෂයෙකුට හොඳ රැකියාවක්, මුදල්, බහුල ලෙස දේපල තිබෙනවා නම් ඔහුට අවශ්‍ය එපමණකි කියා. නමුත් ධනවත් රටවල් දෙස බැලුවොත් එහි පෙනෙන්නේ සතුට නොවෙයි, බොහෝ මානසික ගැටලුය.

මනුෂයයාගේ ප්‍රධාන අවශ්‍යතාවය කුමක්ද? අප මැවූ දෙවියන් වහන්සේ හා සමග සහභාගීකමින් යුතු සතුටුකමින් ජීවත්වීමය. මනුෂයයාට එසේ කිරීමට නොහැකි වන්නේ ඇයි? මනුෂයයා දෙවියන් වහන්සේ ඉදිරියේ පව්කාරයෙක් වන නිසාය. "**සියල්ලෝම පව්කාරව දෙවියන් වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති.**" (රෝම 3:23).

අප සැම දෙනාම ශුද්ධ වූ දෙවියන් වහන්සේ ඉදිරියේ පව්කාරයන් වෙති. පාපය යනුවෙන් අදහස් කරන්නේ දෙවියන් වහන්සේගේ පාලනයට යටත් නොවී, උන්වහන්සේ දෙන්නාවූ නව ජීවිතය ප්‍රතික්



ෂේප කරමින්, උන්වහන්සේට විරුද්ධ වී, උන්වහන්සේගේ ආඥාවලට අකීකරුව ජීවත්වීමය.

අප වෙසෙන ලෝකය දෙස බලන විට අපට පෙනෙන්නේ කුමක්ද? දූෂණ, කැළඹිලි සහ ප්‍රචණ්ඩ ක්‍රියාවලින් පිරුණු ලෝකයකි. මේ දේවල් සිදුවන්නේ නිතැය. එම ක්‍රියාවල් නැවතෙනවා නම් බොහෝ අය සතුටු වෙති. නමුත් සැබෑ සමාදානය කියන්නේ කරදර මධ්‍යයෙහි සිතෙහි සමාදානය ඇතුව ජීවත්වීමය. මෙවැනි සමාදානයක් අපට දෙන්ට හැක්කේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් පමණි.

උන්වහන්සේ ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාය. උන්වහන්සේ අපගේ පව් වෙනුවෙන් කුරුසියේ මැරුණු සේක. "**අපේ පව් නිසා ක්‍රිස්තුස් වහන්සේ මැරී, තැන්පත් කරනු ලැබ, තුන්වෙනිදා නැගිටුවනු ලැබූ සේක.**" (1 කොරින්ති 15:3) "**ඒ ප්‍රේමවන්තයාණන් වහන්සේ තුළ, උන්වහන්සේගේ කරුණාවේ සම්පත් ප්‍රකාරයට, උන්වහන්සේගේ ලේ කරණකොටගෙන අපේ මිදීම වන අපේ වරදවලට කමාව අපට ඇත්තේය**" (එපීස 1:7) එනිසා උන්වහන්සේ තුළින් අපට අපගේ පව්වලට සමාව ලබා ගන්නට හැක. උන්වහන්සේ මළවුන්ගෙන් නැගිට සේක. එනිසා උන්වහන්සේගේ ආත්මය අප තුළට



අවුත් අපට දෙවියන් වහන්සේගේ ජීවනය දෙන්නට හැක. අපගේ දෙමව්පියන්ගෙන් අපට ශාරීරික ජීවනය ලැබුණු සේම අප දෙවියන් වහන්සේගේ දරුවන් වීමට අප උන්වහන්සේගේ ආත්මයෙන් ඉපදිය යුතුයි.

"**යමෙක් අලුතෙන් ඉපදුනොත් මිස ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දකින්නට නොහැක.**" (යොහන් 3:3). අපට එසේ ඉපදිය හැක්කේ කෙසේද? අප ශුද්ධවූ දෙවියන් වහන්සේ ඉදිරියේ පව්කාරයන් බව පිළිගෙන, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපගේ පව් වෙනුවෙන් මැරුණු බව විශ්වාස කොට, අපගේ පව් ගැන අවංක ලෙස පසුතැවිලි වී, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අපගේ ජීවිතයේ පාලනය දිය යුතුයි. ඉන්පසුව, උන්වහන්සේගෙන් අපගේ පව් වලට සමාව ඉල්ලා, උන්වහන්සේගේ ආත්මයට අපගේ හෘදය තුළට එන මෙන් අප ආරාධනා කළ යුතුයි. ඔබ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඔබගේ ස්වාමීන් වහන්සේ සහා පුද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගෙන නැත්නම් අදම උන්වහන්සේව පිළිගන්න. උන්වහන්සේ ඔබට මෙසේ කියන සේක. "**වෙහෙස වන්නාවූ බර උසුලන සියල්ලෙනි මා වෙතට එන්න. මම ඔබට සහනය දෙන්නෙමි.** (මතෙව් 11:28). "**මෙන්න මම දොර ළඟ සිට තට්ටු කරමි. යමෙක් මාගේ හඬ අසා දොර ඇරියොත්, ඔහු වෙතට මම ඇතුල්වන්නෙමි**" (එළිදරව් 3:20).



යේසුස් වහන්සේ ඔබගේ සිත සහ ජීවිතය නමැති දොරට පිට සිටගෙන තට්ටු කරන සේක. ඔබ උන්වහන්සේව ඔබගේ ස්වාමීන්වහන්සේව සහ ගැළවුම්කරු ලෙස පිළිගන්නට කැමති නම් උන්වහන්සේට මෙසේ කථා කරන්න:

"ස්වාමිවූ යේසුස් වහන්ස, ඔබවහන්සේ ඉදිරියේ මා පව්කාරයෙකු බව මම පිළිගනිමි. ඔබවහන්සේ මගේ පව් වෙනුවෙන් පූජාවක් වශයෙන් කුරුසේ මැරුණු බව මම පිළිගනිමි. ඔබවහන්සේ මළවුන්ගෙන් නැගිට්ට බව මම විශ්වාස කරමි. මා මගේ පව් ගැන අවංක ලෙස පසුතැවිලි වී ඔබවහන්සේ මගේ පව්වලට සමාව දෙන මෙන් මම ඉල්ලමි. මගේ සිත සහ ජීවිතය තුළට අවුත් මා තුළ වාසය කරන්න."